# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2345/04 - 2023 අගෝස්තු මස 14 වැනි සඳුදා - 2023.08.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : KES/DS/LND/AC/8/5/22.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2019/HW/627.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 582බී, පැලැන්වත්ත නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පැලැන්වත්ත (කැස්බෑව නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංකය කො 9976 හා 2022.08.29 දිනැති පිඹුරේ කැබලි අංක 1 හි පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0067 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස:

01. **කැබලි අංකය 01**
ඉඩමේ නම: දෙල්ගහකනත්ත, වරි. අංකය - 29/2, මත්තේගොඩ පාර; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි දෙකක කොටස් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: ජනක් ප්‍රියන්ත ගමගේ, මත්තේගොඩ, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0067.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.10.02 වැනි දින අනුව පෙරවරු 10.00 ට කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද 2023.09.25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ. පී. පේමදාස,
ප්‍රාදේශීය ලේකම්,
කැස්බෑව.

2023 අගෝස්තු මස 09 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0131

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : KWDS/LND/01/ACQ/03/2014.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/4/2014/LO/230.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1988/38 හා 2016.10.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවේ පළ කර ඇති දිනය 2016.11.30 ලෙසත් වේලාව පෙ.ව. 10.00ත් සඳහන්ව ඇති අතර එය 2023.10.23 හා වේලාව පෙ.ව. 10.00 ලෙසටත් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

සංජීවනී කන්ඩම්බි,
ප්‍රාදේශීය ලේකම්,
කලවාන.

2023 අගෝස්තු මස 08 වැනි දින,
කලවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0132

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.